**කුරුණෑගල ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟහිටි ත්‍රීරෝද රථ සංගම් බලපත්‍ර ගාස්තු රු.15,400ක් හර හා බැර ලෙස ගිණුම් 02 ක ගිණුම්ගත කර තිබුණි. | වැරදීමකින් ගිණුම් දෙකක ගිණුම්ගත වීමේ වරද ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමේදී කලින් ලද ආදායම් රු.72,377 ක් දෙවරක් බැරට සටහන් කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ ගිණුම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂය අතර රු.19,372,995 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඈ) | සේවක ණය ගිණුමේ ශේෂය රු.359,045 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඉ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිර්දේශ අනුව අපහරණය කර තිබූ පුස්තකාල පොත් වටිනාකම රු.42,803 ක් ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.. | -එම- | -එම- |
| (ඊ) | ප්‍රතිපාදන බලපත්‍ර හා පළාත් පාලන නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2023 වර්ෂය තුළ වැඩ අවසන් කර තිබූ රු.1,837,668 ක ගොඩනැගිලි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | 2023 වර්ෂයේ සහා අරමුදල් යටතේ නිමකර තිබූ කර්මාන්ත 04 ක වටිනාකම රු.8,959,842 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | 2024 වර්ෂය තුළ ගෙවා තිබූ 2023 වර්ෂයට අදාළ විවිධ ණය හිමියන් රු.103,080 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද පුස්තකාල පොත් වටිනාකම රු.527,810 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩියෙන් සටහන් වීමේ වරද ඉදිරියේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඒ) | 2023 වර්ෂයේ සහා අරමුදල් ණයහිමියන් රු.1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අඩුවෙන් ගිණුම් ගත කර ඇති මුදල උපලේඛනය සකස් කර නිවැරදි කරන බව. | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ සහා අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් රු.954,962 ක් ණය හිමියන් ලෙස වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඇස්තමේන්තුගත වැඩ විෂයන් කිහිපයක් ඉටු නොකිරීම නිසා ණයහිමි ලේඛනයේ ඇතුළත් කරන ලද මුදලට වඩා අඩුවෙන් ගෙවා ඇති බවත්.අනුමැතියට ඉදිරිපත් කිරීමේදී ඇතැම් වැඩ කොටස් සිදුකිරීම අත්‍යවශ්‍ය නොවූ බැවින් එම කොටස් හැර ඇස්තමේන්තු සකස් කිරීමට සිදුවූ බවත්. | -එම- |
| (ඕ) | 2017 වර්ෂයේ වයඹ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් ණය හිමියන් ලෙස රු. 132,636 වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | උප ලේඛනයක් සකස් කර වැඩිපුර ගිණුම්ගත කර තිබූ වටිනාකම් වේ නම් ඒ මුදල් විධිමත් පරිදි කපා හැරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | සභාව සතු මිංහෙට්ටිය මහජන පුස්තකාලය හා දෙමළුස්ස ප්‍රජාශාලා ගොඩනැගිල්ල 2020 හා 2021 වර්ෂවල රු.1,355,000 කට තක්සේරු කර තිබුණද එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ග) | වටිනාකම රු.100,000 ක් වූ ඉඩමක් දෙවරක් ඉඩම් ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ච) | සභාව සතු ගල් රෝලය හා ගලි රථ ටේලරයේ තක්සේරු වටිනාකම රු.9,500,000 ක් මෝටර් රථ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ජ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු 22 දින යාන්ත්‍රික ඉංජිනේරු විසින් සිදුකළ තක්සේරුව අනුව සභාව සතු වාහනවල වටිනාකම රු.3,122,589 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ට) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් වටිනාකම රු.2,041,600 ක් වූ යන්ත්‍ර උපකරණ අයිතම 04 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඩ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් වටිනාකම රු.151,000 ක් වූ වතුර මෝටරය හා ශ්‍රවනාගාර උපකරණ වල වටිනාකම සහ රු.450,400 ක ලී බඩු උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ත) | වැඩසටහන් 05 පොදු උපයෝගිතා තුළ ඇතුළත් ප්‍රාග්ධන වියදම් වටිනාකම රු.1,613,975 ක් එම වැඩ සටහන තුළ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ද) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලිය රු.2,099,523 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.771,861,989 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් හා උපලේඛනයේ ශේෂයන් අතර රු.225,042,277ක වෙනසක් විය. | උපලේඛණ හා මූල්‍ය ප්‍රකාශන ශේෂය නොසැසඳුම් ඉදිරියේදී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.172,058,063 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 06 කට අදාළ ශේෂයන් හා ගොඩනැගිලි ලේඛනයේ/ තක්සේරු වාර්තා අතර රු.36,926,969 ක වෙනසක් විය. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන ශේෂය නොසැසඳුම් ඉදිරියේදී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව හිමිකම රු.1,307,503,157 ක් වන අතර ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට අනුව වටිනාකම රු.1,326,852,987 ක් විය. ඒ අනුව රු. 19,349,830 ක වෙනසක් විය. | උපලේඛණ හා මූල්‍ය ප්‍රකාශන ශේෂය නොසැසඳුම් ඉදිරියේදී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 286,580,953 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සොයා බලා ඉදිරියේදී නිවැරදි කරන බව. | අවශ්‍ය ලිඛිත සාක්ෂි ලබාදිය යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 571 (2) | වසර 02 කාලය ඉක්ම වූ වටිනාකම රු.9,339,313 ක මිශ්‍ර තැන්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉල්ලුම්කරුවන් වෙත දුරකථන මාර්ගයෙන් දැනුම් දී සිහි කැඳවීම් ලිපිද යවා ඇති බවත්, කළමණාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා තීරණයක් ලද වහාම ආදායමට ගැනීමට කටයුතු | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 06 වගන්තියේ (ආ) හා (ඇ) | 2023 වර්ෂයේදී අලුත් කළ යුතු පරිසර ආරක්ෂක බලපත්‍ර 11 ක් අලුත් කර එම ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ඉටුකර නොතිබුණි. | 2023 වර්ෂයේ අලුත් කළ යුතු පරිසර ආරක්ෂණ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | චක්‍රලේඛය අනුව ආදායම් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පීඩා පරීක්ෂා කිරීම 100 වගන්තිය | සභාවට එරෙහිව පවරන ලද නඩු කටයුතු 07 කට අදාළව වූ පීඩා පරීක්ෂා කර නිසි පිළියමක් ගෙන නොතිබුණි. | සභාව මගින් මහජනයා උදෙසා සේවාවන් ඉටුකිරීමට යාමේදී පනත ප්‍රකාරව මහජනයා කටයුතු නොකිරීම මත ඇති වූ තත්ත්වයන් බවත් ඒවා ඔවුන් විසින්ම අත්තනෝමතිකව සභාව වෙත පැවරූ නඩු බවත්. | ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව පීඩා පරික්ෂා කිරීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.244,928,314 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 295,226,983 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ ඉතිරි කිරීමේ ගිණුමේ සමාලෝචිත වර්ෂය පුරාවට රු. මිලියන 160 කට වැඩි සාමාන්‍ය ශේෂයක් රඳවා තබා ගැනීම නිසා ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකිව තිබූ ඉහල ප්‍රතිලාභයක් සභාවට අහිමි වී තිබුණි. | ස්ථාවර තැන්පත් විවෘත කිරීමට කටයුතු කරන බව. | සභාවට ආදායම් උත්පාදනය කර ගත හැකි අවස්ථා සොයා බලා ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගතආදායම් රැස්කළ ආදායම් හා ,බිල්කළ ආදායම් ,හිඟ ආදායම්

ලේකම් වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 11,244 | 17,358 | 16,851 | 12,791 | 16,860 | 19,241 | 12,199 | 12,532 |
| කුලී | 1,253 | 2,455 | 2,269 | 238 | 2,460 | 1,855 | 1,803 | 52 |
| බලපත්‍ර ගාස්ත | 2,201 | 2,761 | 2,761 | - | 1,975 | 2,781 | 2,781 | - |
| වෙනත් ආදායම් | 125,405 | 385,438 | 312,424 | 190,180 | 145,328 | 183,149 | 58,897 | 124,252 |
| **එකතුව** | 140,103 | 408,012 | 334,305 | 203,209 | 166,623 | 207,026 | 75,680 | 136,836 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු. මිලියන 408 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාළව හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රු. මිලියන 334 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 203 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් 2018 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුවක් මත පදනම්ව 2023 වර්ෂය සඳහාද වරිපනම් අයකරමින් පැවති අතර, ඒ හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සිදුකිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | නව තක්සේරුවක් ලබාගෙන ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු බදු දිය හැකි වත්කම් 99 න් 2023 දෙසැම්බර් 31 දින වන විට වත්කම් 48 ක් පමණක් බදු දීමට කටයුතු කර තිබූ අතර ඉතිරි වත්කම් 51 නැවත ටෙන්ඩර් කර හෝ වෙනත් ආකාරයකින් බදු දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | බදු දිය යුතු වත්කම් සියල්ල තෙවතාවක් ටෙන්ඩර් කර ඇති බවත් කිසිදු ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් වී නැති බවත්. | බදු දිය හැකි වත්කම් බදු දීමට හා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් වෙන්දේසි කරන තැරැව්කාර ආයතන 02 ක ඉඩම් 04 ක් කට්ටිකර විකිණීමට අදාලව ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රවල කට්ටි සැලැස්මේ පවතින අඩුපාඩු සකස් කර එම ඉඩම් කට්ටි කිරීම නීත්‍යානුකූල ක්‍රියාවලියකට අනුගතව කිරීමට ඉඩම් වෙන්දේසිකරුවන් විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර විගණිත දිනය වූ 2024 පෙබරවාරි 15 දින වන විටත් එම ආයතන වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට හෝ එම වෙන්දේසි කටයුතු පාලනය කිරීමට හෝ කිසිඳු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි. | සැලසුම් කමිටුවට යොමුකොට තීරණයක් ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | විධිමත් නියාමනයක් පවත්වා ගැනීම කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැල්ලව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීමේ පළමු අදියරේ ගිවිසුම්ගත වටිනාකම රු.77,745,538 ක් වුවත් අවසන් බිලට අනුව කළ වැඩ වටිනාකම රු. 33,421,312 ක් වූ අතර ගිවිසුම්ගත වටිනාකමත් කළ වැඩ වටිනාකමත් අතර වෙනස සියයට 57ක් වූයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ව්‍යාපෘතියේ සියලු වැඩ නිසි පරිදි ඇස්තමේන්තු කර නොතිබූ අතර ප්‍රමාණ පත්‍රයේ සඳහන් සිවිල් වැඩ විෂය යටතේ දක්වා තිබුණ එකතු වටිනාකම රු. 2,810,889 ක් වූ වැඩ විෂයයන් 07 ක කාර්යයන් ඉටු නොකර අතහැර දමා තිබුණි. | රටේ පැවති ආර්ථික තත්වය හේතුවෙන් තවදුරටත් මෙම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යාම ප්‍රාදේශීය සභාවට අවාසි සහගත වන බැවින් මෙලෙස වැඩ විෂයයන් 07ක් ඉටු නොකර අතහැර දැමීමටත් වැඩවිෂයයන් 21ක ඇස්තමේන්තුගත ප්‍රමාණය සීමා කිරීමටත් සිදු වූ බව | ඇස්තමේන්තු අනුව වැඩ කොටස් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත නොකරන ලද රු.21,450,000 ක් වූ කර්මාන්ත 12 ක් නිමකර තිබුණි. | බලවත් මහජන ඉල්ලීම් මත කඩිනමින් සංවර්ධනය කළ යුතු කර්මාන්ත අදාල අනුමැතීන් ලබාගෙන සිදුකරන බව. | අවශ්‍යතා හඳුනාගෙන අයවැයගත කිරීම කළ යුතුය. |